**ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය**

**දෙවන වාර පරීක්ෂණය - 2018**

| | | |
|---|---|---|
| **08 ශ්‍රේණිය** | **සංගීතය I - II** | **කාලය පැය 01** |

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. "ඇහැළමහට ඇහැල ගහක" සහ "සිරස නම්මු මවු පොළොවට" ගීතයන් පිළිවෙළින්,
   - I. බිලාවල් හා භූපාලි රාගයන්ගේ ස්වර ස්ථාපන ස්ථාපන ගීතයන් ය.
   - II. භූපාලි හා බිලාවල් රාගයන්ගේ ස්වර ස්ථාපන ගීතයන් ය.
   - III. කෝමළ ග නි ඇතුළත් ස්වර ස්ථාපන ගීතයන් ය.
   - IV. ශුද්ධ ස්වර ඇතුළත් ස්වර ස්ථාපන ගීතයන් ය.
2. මිශ්‍ර මත්කැටි සහිත හින්දුස්ථානි තාල පද යුගලයකි.
   - I. ත්‍රිතාලය - දීප්චන්දි තාලය
   - II. කෙහෙරේවා තාලය - මහ තනි තිත
   - III. දීප්චන්දි තාලය - ඛඩප් තාලය
   - IV. සුළු තනි තිත - මැදුම් තනි තිත
3. හින්දුස්ථානි තාල පද්ධතියේ එන තාල ස්ථාන කිහිපයකි.
   - I. සමග්‍රහ, තිත, ඛලිය
   - II. තෙයි, තිත්, සමග්‍රහය
   - III. අනුතාල ස්ථාන, ඛලිය, තිත
   - IV. සමග්‍රහ, ඛලිය, අනුතාල ස්ථාන
4. "රන්වන් කරල් සැලෙයි" ගී පාදය නිවැරදිව ප්‍රස්තාර කර ඇති වරණය වනුයේ,
   - I. රන් / වන්ක / රල් / සැලෙයි /
   - II. රන්ව / න්කS /රල්සැ / ලෙයිS /
   - III. රන්වන් /කරල්S / සැSලෙS / යිSSS
   - IV. රන්ව / නකS / රල්සැ / ලෙයිS
5. පහත සඳහන් සංගීත භාණ්ඩ අතරින් ස්වර පුවරු භාණ්ඩ යුගලයකි.
   - I. වයලීනය - තබ්ලාව
   - II. සිතාරය - එස්රාජය
   - III. සින්තසයිසරය - එකෝඩියනය
   - IV. සර්පිනාව - ගිටාරය
6. "සිරි සරු සාර කෙතේ ගොයම් පැසිලා මහිමේ" ගීතය ගයනුයේ,
   - I. සුනිල් ශාන්ත මහතා හා රුක්මනී දේවි මහත්මිය විසිනි.
   - II. ආනන්ද සමරකෝන් මහතා ස්වර්ණා ද සිල්වා මහත්මිය විසිනි.
   - III. ධර්මදාස වල්පොල මහතා හා ලතා වල්පොල මහත්මිය විසිනි.
   - IV. එඩ්වඩ් ජයකොඩි මහතා හා නන්දා මාලනී මහත්මිය විසිනි.

7. “මුදු පුත්තු”නාට්‍ය හා “කුණ්ඩලකේෂි” නාට්‍යය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

I. මුදු පුත්තු නාට්‍ය නිෂ්පාදක පී.වැලිකල මහතා වන අතර කුණ්ඩලකේෂි නාට්‍ය නිෂ්පාදක ගුණසේන ගලප්පත්ති මහතය.

II. නාට්‍ය දෙකෙහිම ගීපද රචකයා මහගමසේකර මහතාය.

III. කුණ්ඩලකේෂි නාට්‍යයේ සංගීත අධ්‍යක්ෂකවරයා ලයනල් අල්ගම ශූරීන් වන අතර මුදු පුත්තු නාට්‍යයේ සංගීත අධ්‍යක්ෂකවරයා සෝමදාස ඇල්විටිගල මහතාය.

IV. “අන්න බලන් සඳ රන් තැටියෙන්” ගීතය නව නාට්‍ය සම්ප්‍රදායට අයත් වන අතර මුදු පුත්තු නාට්‍යය නාඩගම් සම්ප්‍රදායට අයත් වේ.

8. **XX-** / **XXX-** / **XX-** / **XXX-** මෙම රිද්ම රටාවට ගැළපෙන හින්දුස්ථානි තාලය

I. ඣප් තාලය　　II. ත්‍රි තාලය

III. දීප්චන්දි තාලය　　IV. බේම්ටෝ තාලය

9. කෝමල ග නි සහ ශුද්ධ ස්වර ඇතුළත් සරල ගී යුගලය පිළිවෙලින්,

I. රජ මැදුරක ඉපදී සිටියානම් - තැන තැන රවුමට ඉදගෙන

II. සරුංගලේ වරල් සැලේ - මල් පිබිදීගෙන එන්නේ

III. ඕලු පිපිලා විල ලෙල දෙනවා - ආදරේ ඇයි පොඩි හඳ මාමේ

IV. නිල් අහස තලේ අගේ - මගේ පුතු හරි හපනා

10. අලුව භාවිතයෙන් වයන සංගීත භාණ්ඩ යුගලයකි.

I. සිතාරය - ගිටාරය　　II. එස්රාජය - වයලීනය

III. තබ්ලාව - බටනලාව　　IV. වයලීනය - සිතාරය

11. ගැමි ගී හා සෙ ගී සම්බන්ධව නිවැරදි වරණය වනුයේ,

I. කමත් ගී ගැමි ගී විශේෂයකි. - සෙ ගී උගතුන් විසින් නිර්මාණය කර ඇත.

II. නෙලුම් ගී සෙ ගී විශේෂයකි .- ගැමි ගී සාමාන්‍ය ජනයා අතර පවතී.

III. ගැමි ගී වල සරල බස් වහරක් ඇත. - සෙ ගී මහන්සිය නිවා ගැනීමට ගයා ඇත.

IV. ගැමි ගී වල පටු ස්වර පරාසයක් ඇත. - සෙ ගී මුඛ පරම්පරාවෙන් පැවත එයි.

12. “දවසක් පැල නැති හේනේ” සහ “අම්මා සඳකි මම ඒ ලොව” මෙම ගීත යුගලය පිළිවෙලින්,

I. මවු ගුණ වරුණ ගී යුගලයකි.

II. පිය ගුණ වරුණ ගී යුගලයකි.

III. පිය, මවු ගුණ වරුණ ගී යුගලයකි.

IV. මවු, පිය වරුණ ගී යුගලයකි.

13.නීතිඥ ජෝන් ද සිල්වා ශූරීන් සහ නීතිඥ චාල්ස් ඩයස් ශූරීන් විසින් නිෂ්පාදිත නූර්ති ගී යුගලයකි.

I. වෙස්සන්තර නූර්තිය - ශ්‍රී වික්‍රම නූර්තිය

II. හේමමාලි නූර්තිය - වෙස්සන්තර නූර්තිය

III. දුටු ගැමුණු නූර්තිය - රාමායනය නූර්තිය

IV. ශ්‍රී වික්‍රම නූර්තිය - හේමමාලි නූර්තිය

14. "පායාලා අඹරේ චන්ද්‍රයා දිසි සුන්දර රූපේ මාගේ" මෙම ගී පාදය

I. නූර්ති රංග ශෛලියට අයත්ය.

II. නව නාට්‍ය රංග ශෛලියට අයත්ය.

III. නාඩගම් රංග ශෛලියට අයත්ය.

IV. කෝලම් රංග ශෛලියට අයත්ය.

15. පැදි පාදයක අග සහ පැදි පාදයක මැද පිහිටන අවස්ථාද ඇත්තේ,

I. තිත     II. යතිය     III. සදෑසමත් ය     IV. ගී මත්ය

16. "උදයට පායන හිරු දෙවියන්ටයි" මෙම ගී පාදය,

I. මාත්‍රා 2න් 2ට ගැයෙන තුන් සරණේ ගීතයකි.

II. මාත්‍රා 3න් 3ට ගැයෙන ගොයම් ගීතයකි.

III. මත්‍රා 4න් 4ට ගැයෙන කමත් ගීතයකි.

IV. මාත්‍රා 3න් 3ට ගැයෙන නෙලුම් ගීතයකි.

17. යතුරු පුවරුවක කෝමල ගාන්ධාරය හා කෝමල නිශාදය පිහිටා ඇත්තේ,

I. ගාන්ධාරය හා මධ්‍යමය අතරත් පංචමය හා ධෛවතය අතරත්ය.

II. රිෂභය හා ගාන්ධාරය අතරත් ධෛවතය හා නිශාදය අතරත්ය.


III. ෂඩ්ජය හා රිෂභය අතරත් මධ්‍යමය හා පංචමය අතරත්ය.

IV. මධ්‍යමය හා ධෛවතය අතරත් නිශාදය හා ෂඩ්ජය අතරත්ය.

18. දීප්චන්දි තාලයට හා ඣප් තාලයට අයත් මාත්‍රා සංඛ්‍යාව පිළිවෙළින් දක්වා ඇත්තේ,

I. මාත්‍රා 6, මාත්‍රා 8     II. මාත්‍රා 6, මාත්‍රා 14

III. මාත්‍රා 10, මාත්‍රා 14     IV. මාත්‍රා 14, මාත්‍රා 10

19.  බටහිර සංගීතයේදී භාවිත වන මෙම සංකේතයේ අගය නිවැරදිව දැක්වෙන වරණය නම්,

I.      II. 

III.      IV. 

20. සරල සංගීතයට **Counter Parts** වැඩි වශයෙන් ඇතුළත්ව පළමුව නිර්මාණය වූ ගීතය,

I. දවසක් පැල නැති හේනේ

II. සඳකඩ පහනක කැටයම් ඔපලා

III. සරුංගලේ වරල් සැලේ

IV. රජ මැදුරක ඉපදී සිටියානම්

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

1. හිස්තැන් පුරවන්න.

I. ..................................................... භජන් ගීතයක් වන අතර "චින්න චින්න අසයි" දමිල ගීතයේ සංගීත නිර්මාණය කරන ලද්දේ ..................................................... විසිනි.

II. කාන්තාවන් විසින් ගායනා කරන ගී විශේෂයක් ලෙස ..................................................... ගී හැඳින්විය හැකි අතර පුරුෂයන් විසින් ගයන ගී විශේෂයක් ලෙස ..................................................... ගී හැඳින්විය හැක.

III. හින්දුස්ථානි තාලයක අවනද්ධ පදය ..................................................... නමින් හැඳින්වෙන අතර හින්දුස්ථානි තාලයක දුර්වල තාල ස්ථානය හැඳින්වීම සඳහා ..................................................... සංකේතය භාවිතා කරයි.

IV. **Chrochet** එකක වටිනාකම මාත්‍රා ................ ක් වන අතර මාත්‍රා 3 වටිනාකමකින් යුත් සංකේතය ..................................................... වේ.

V. "බෝ දොස් කියා මගේ" ගීතය අයත් නූර්තිය ..................................................... වේ.

VI. භූපාලි රාගයේ මධ්‍යමය හා ..................................................... නොයෙදේ.

2. I. සරල ගීතයක කොටස් 6ක් නම් කරන්න.

II. ඉන් කොටස් දෙකක් සරලව පැහැදිලි කරන්න.

III. සුභාවිත ගීත රචකයන් තිදෙනෙක් නම් කර ඔවුන් විසින් නිර්මාණය කල ගීත 3ක් නම් කරන්න.

3. I. සදෑස්මත් හා ගීමත් පැහැදිලි කරන්න.

II. "ඉපල් පිටින් ගහන අව්ව පිටට ඉහිර වන්නේ" මෙහි සදෑසමත් ගණන හා ගීමත් ගණන ලියන්න.

III. "රන් දෑකැති ගෙන නිති සැරසෙනවා" මෙම ගී පාදයේ ඇතුළත් ලඝු, ගුරු මාත්‍රා සංඛ්‍යාව නියමිත සලකුණු යොදා ලකුණු කොට ලඝු,ගුරු මාත්‍රා ගණන වෙන් වෙන් වශයෙන් ලියන්න.

4. I. සිතාරය හෝ එස්රාජය ඇද කොටස් 6ක් නම් කරන්න.

II. ඔබ අඳින ලද සංගීත භාණ්ඩය හැර අනෙක් සංගීත භාණ්ඩය පිළිබඳ කරුණු 4ක් ලියන්න.

5. I. බිලවල් හෝ භූපාලි රාගයේ ස්වර ස්ථාපන ගීතයක ස්ථායී කොටස පද ප්‍රස්තාර කරන්න.

II. ඔබ ප්‍රස්ථාර කරන ලද ස්වර ස්ථාපන ගීතය වැයීමට සුදුසු තාලය නම් කර ප්‍රස්ථාරකර දක්වන්න.

III. ස්වර සප්තකය බටහිර රේඛා මණ්ඩලය මත Seme Breve Notes භාවිතා කරමින් ලකුණු කරන්න.